## (8) 1990 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පිළිබඳ ප්‍රඥප්තිය.

දකුණු පළාත තුළ පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ඒ පළාතේ ආණ්ඩුකාරවරයා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ අනුශංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ පළාත් සභාව විසින් මෙසේ සම්මත කර ගනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය

**01.** මේ ප්‍රඥප්තිය 1990 අංක 04 දරන පළාත් සභා (පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පැවරීම) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

කාර්යක්ෂමතාව මත පළාත් පාලන ආයතන විසුරුවා හැරීම සඳහා අමාත්‍යවරයා සතු බලතල

**02.** (1) පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා, කවර වුවද අවස්ථාවකදී පහත සඳහන් කරුණු ගැන, එනම් යම් මහ නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක පිළිවෙලින් නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ හෝ යම් සභිකයෙකුගේ ,

(අ) අකාර්යක්ෂමතාවය හෝ නොමනා පාලනය, හෝ දූෂණ ක්‍රියා හෝ

(ආ) අදාළ නීතිය මගින් හෝ වෙනත් ලිඛිත නීති මගින් නියම කොට ඇති කාර්ය කිරීම ඔහු විසින් දිගටම පැහැර ඇති බවට; හෝ

(ඇ) නීතියේ විධි විධාන කිසිවෙකට අනුකූලව ක්‍රියා කිරීම ඔහු විසින් දිගටම ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැර ඇති බවට; හෝ

(ඈ) අදාළ නීතිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පනවා ඇති බලතල ඔවුන් විසින් අනිසි ලෙස පාවිච්චි කළ බවට; හෝ

(ඉ) රැස්වීම පැවැත්වීම නැතහොත් රැස්වීම්වල පැමිණ සිටීම හෝ පවත්වන ලද රැස්වීමක ඡන්දය පාවිච්චි කිරීම හෝ රැස්වීමේ කටයුතු කිරීම හෝ නගරාධිපතිවරයා නැතහොත් සභාපතිවරයා විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සභිකයෙකු විසින් නිරතුරුවම ප්‍රතික්ෂේප කර ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි තමාට ඇති විට, අමාත්‍යවරයා විසින් ඒ එක් එක් අවස්ථාව සම්බන්ධයෙන් අවශ්‍ය වන පරිදි, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් ,



(I) එකී මහ නගර සභාවේ නගරාධිපතිවරයා නැතහොත් නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ධූරයෙන් පහ කරනු ලැබිය හැකිය . එසේ නැතහොත්,

(II) සභිකවරුන් සියළු දෙනාම හෝ ඔවුනතුරෙන් කිසිවකු ධූරයෙන් පහ කරනු ලැබිය හැකිය . එසේ ද නැතහොත්,

(III) පළාත් පාලන ආයතන විසුරුවා හරිනු ලැබිය හැකිය.තවද එසේ කිරීමෙන් පසු එවැනි යම් නියමයක් හැකි තාක් ඉක්මනින් පළාත් සභාව ඉදිරියේ තැබිය යුතුය.

(2) අමාත්‍යවරයා විසින්, (1) වන උප වගන්තිය යටතේ නියමයන් කිරීමට පෙර, එකී උප වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් තමන් සෑහීමකට පත්වීම සඳහා, ඒ කරුණු ගැන පරීක්ෂා කර බලා මාස තුනක් ඇතුළතදී වාර්තා කිරීම පිණිස, විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු පත් කළ යුතුය. එසේ පත් කරන ලද විනිශචයකාරවරයාට ඒ පරීක්ෂණයට අදාළව පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂමක බලතල ඇත්තේය.

**03**. (අ) යම් කාරණයක් ගැන පරීක්ෂා කිරීම සඳහා විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙකු 2 (2) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ විට, එක් එක් අවස්ථාවට අනුකූලව අවශ්‍ය වන පරිදි, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල කරනු ලබන ආඥාවක් මගින්

(i) අවස්ථාවෝචිත පරිදි එකී මහ නගර සභාවේ නගරාධිපතිවරයෙකු නැතහොත් නගර සභාවේ හෝ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාගේ ධූරය අත්හිටවනු ලැබිය හැකි අතර, ඒ නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ බලතල පාවිච්චි කිරීමට සහ කාර්ය ඉටු කිරීමට අවස්ථාවෝචිත පරිදි, නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ උප නගරාධිපතිවරයාට විධාන කළ හැකිය.

(ii) තවද, ඒ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ හෝ උප සභාපතිවරයාගේ ධූරය හිස් වී තිබේ නම් නැතහොත් අත්හිටුවා තිබේ නම් නගරාධිපතිවරයාගේ හෝ සභාපතිවරයාගේ සහ සභාවේ බලතල පාවිච්චි කිරීමට සහ කාර්ය කිරීමට අවස්ථාවෝචිත පරිදි, නාගරික කොමසාරිස්වරයාට හෝ තත් ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට නියම කළ හැකිය. මෙවැනි අවස්ථාවකදී අදාළ සභාව තාවකාලිකව අත්හිටවූ සේ සැලකිය යුතුය. එසේම,



(iii) යම් සභිකවරයෙකුගේ ධූරය හෝ සභිකවරු කිහිපදෙනෙකුගේ ධූර අත් හිටුවිය හැකිය; එසේ නැතහොත්,

(iv) සභාව අත්හිටුවා, සභාවේ සහ මහ නගර සභාවක් සම්බන්ධයෙන් එකී නගරාධිපතිවරයාගේද, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් එහි සභාපතිවරයාගේද, බලතල පාවිච්චි කිරීමට සහ කාර්ය කිරීමට අවස්ථාවෝචිත පරිදි ,නාගරික කොමසාරිස්වරයාට හෝ තත් ප්‍රදේශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට නියම කළ හැකිය.

**04.(1)** ඉහත කී 2 (2) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ අධීක්ෂණ නිලධාරියාගේ වාර්තාව ලැබුණු විට, අමාත්‍යවරයා විසින්,

(2) (1) වන උප වගන්තිය යටතේ නියමයන් කරන ලද හෝ 3 වන වගන්තියේ (අ) ඡේදය යටතේ කරන ලද ආඥාව ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම කළ හැකිය.

(3) අමාත්‍යවරයා විසින් යම් මහ නගර සභාවක් සම්බන්ධයෙන් නම් එහි නගරාධිපතිවරයා හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් නම් එහි සභාපතිවරයා ධූරයෙන් ඉවත් කරනු ලැබූ අවස්ථාවකදී ඒ නගරාධිපතිවරයා හෝ සභාපතිවරයාගේ සභික ධූරය අවසන් වන අතර, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධාන එවිට අදාළ වන්නේය.

5. විසුරුවා හරිනු ලැබූ මහ නගර සභාව වෙනුවට අලුත් මහ නගර සභාවක් මහ නගර සභා ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව සංස්ථාපනය කළ යුතු යයි හෝ අනෙක් අවස්ථාවලදී නම විසුරුවා හරිනු ලැබූ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව වෙනුවට අළුත් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් එයට අදාළ නීතියේ විධිවිධානවලට අනුකූලව සංස්ථාපනය කළ යුතු යයි, ඉහත සඳහන් ආකාරයටම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තදනන්තර නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකිය.

6. මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක්ම, ඒ නියමය බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විධාන අඩංගු විය යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට නීතියේ බලය ඊට ලැබෙන්නේය.

7. මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසුරුවා හැරීමෙන් පසු ඒ මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව වෙනුවට අලුත් මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සංස්ථාපනය කරනු ලැබූ අවස්ථාවකදී ඒ අලුත් මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව සංස්ථාපනය කිරීමට පෙරාතුවම අදාළ නීතිය නැතහොත් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව හෝ වෙත පවරා තිබුණු හෝ පනවා



තිබුණු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල කාර්ය සහ කර්තව්‍ය පාවිච්චි කළ, ඉටු කළ හෝ සිදු කළ තැනැත්තාගේ හෝ තැනැත්තියගේ අනුප්‍රාප්තිකයා බවට එසේ අලුතින් සංස්ථාපිත මහ නගර සභාව හෝ නගර සභාව හෝ ප්‍රාදේශීය සභාව එක් වන්නේය.

අර්ථ නිරූපණය

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වේ.

"පළාත් පාලන සහකාර කොමසාරිස්" යන්න යම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් යෙදෙන විට එම පළාත් පාලන ආයතනය පිහිටි දිස්ත්‍රික්කය සඳහා පත් කරනු ලැබ ඇති පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා ඉන් අදහස් වේ.

"අදාළ නීතිය" යන්නෙන් පිළිවෙලින් මහ නගර සභාවක් හෝ නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් මහ නගර සභා ආඥා පනත (252 වන අධිකාරිය) නගර සභා ආඥා පනත (255 වන අධිකාරිය) හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අදහස් වේ.